17

ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම සඳහා අවම භෞතික සම්පත් කළමනාකරණය කරගන්නේ කෙසේ ද?

ඒ. විදුශාන් චාමර

අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

සාරසංක්ෂේපය

(අවම භෞතික සම්පත් සහිත පාසලක් සම්බන්ධ ව සිදු කළ ප්‍රත්‍යෙයක අධ්‍යයනයක් ඇසුරෙන්)

අවම භෞතික සම්පත් සහිත පාසලක අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා සීමිත භෞතික සම්පත් කාර්යක්ෂම ව කළමනාකරණය කර ගන්නා ආකාරය පිළිබඳ ව ප්‍රායෝගික අධ්‍යයනයක් සිදු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. නගර සීමාවෙන් බැහැර ග්‍රාමීය පාසලක් කේන්ද්‍ර කොටගෙන මෙම පර්යේෂණය සිදු කරන ලදී. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය මත පදනම් විය. දත්ත ලබා ගැනීම සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ ලේඛන සමීක්ෂණ ක්‍රමවේදයන් ඔස්සේ සිදු විය. සහේතුක නියැදි ක්‍රමය යටතේ පාසලේ විදුහල්පතිවරයා, ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන්ගෙන් ලබා ගන්නා ලද දත්ත තේමා ආශ්‍රිත විශ්ලේෂණ ක්‍රමය යටතේ විශ්ලේෂණය කරන ලදී. පර්යේෂණ ප්‍රතිඵල අනුව භෞතික සම්පත් හිඟකම විභාග ප්‍රතිඵල පහත වැටීමට ප්‍රධාන හේතුවක් බව හෙළි විය. එහෙත් විදුහල්පතිවරයාගේ ඵලදායී මග පෙන්වීම, ගුරුවරුන්ගේ කැපවීම සහ ප්‍රාදේශීය ප්‍රජාවගේ සහයෝගය තුළින් සීමිත සම්පත් උපරිමයෙන් උපයෝගී කරගත හැකි බව තහවුරු විය. පවතින සම්පත් බෙදා හැරීම, හවුල් භාවිතය සහ අලුත්වැඩියා කිරීම තුළින් පන්ති කාමර, විද්‍යාගාර සහ පුස්තකාල කාර්යක්ෂම ව පවත්වා ගත හැකි බව සොයා ගන්නා ලදී. අවසාන වශයෙන්, අවම සම්පත් සහිත පාසල්වල විභාග ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ප්‍රධාන වශයෙන් විදුහල්පතිවරයාගේ සැලසුම් සහගත කළමනාකරණය, ගුරුවරුන්ගේ නවීන ඉගැන්වීම් ක්‍රම සහ ප්‍රජා සහභාගීත්වය අත්‍යවශ්‍ය සාධක බව නිගමනය කෙරිණි. සීමිත සම්පත් නිදහසක් ලෙස නොසලකා ඒවා නිර්මාණාත්මකව භාවිත කිරීමෙන් අධ්‍යාපන ප්‍රමිතිය ඉහළ නැංවිය හැකි බව මෙම අධ්‍යයනයෙන් තහවුරු විය.

මුඛ්‍ය පද:

භෞතික සම්පත්, භෞතික සම්පත් කළමනාකරණය, අවම භෞතික සම්පත් සහිත පාසල්, භෞතික සම්පත් සීමාවන්, අත්‍යවශ්‍ය ඉගෙනුම් උපකරණ

හැඳින්වීම

විධිමත් සංවිධානයක් ලෙස පාසලේ සාර්ථකත්වය හා ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා භෞතික සම්පත් අවශ්‍ය වේ. ඒ පිළිබඳ විවිධ පුද්ගලයන් හා ආයතන මගින් මෙසේ අවධාරණය කොට ඇත. “ඵලදායී ලෙස ඉගැන්වීමට හා ඉගෙනීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම, සිසුන්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම හා අධ්‍යාපන සාර්ථකත්වය පෝෂණය කිරීම සඳහා ප්‍රමාණවත් භෞතික සම්පත් අත්‍යවශ්‍ය වේ” (Hammond et al, 2020). “භෞතික සම්පත් මගින් ශිෂ්‍ය ක්‍රියාකාරකම් හා ජයග්‍රහණ සඳහා මග පෙන්වන ආරක්ෂිත, සුවපහසු හා ක්‍රියාකාරී පරිසරයක් නිර්මාණය කිරීමෙන් ඵලදායී ඉගැන්වීම හා ඉගෙනීම සඳහා පදනම සපයයි” (Hammond et al, 2020). පාසල් ඵලදායිතාවයේ විෂමතා ඇති වීම සඳහා භෞතික සම්පත්වල ප්‍රමාණය හා භාවිතය ප්‍රධාන සාධකයක් ව ඇති බව හෙට්ටිගේ (2010) පෙන්වා දී ඇත. පාසලක සාර්ථකත්වය, ඵලදායී බව හා ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා පාසලේ පවතින භෞතික සම්පත් තීරණාත්මක බලපෑමක් ඇති කරන බව පැහැදිලි ය.

පාසලේ ඇති භෞතික සම්පත් ප්‍රමාණය ශිෂ්‍ය ජයග්‍රහණ කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති නොකරන බව ද පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත. Ibrahim ඇතුළු පිරිස (2017) පෙන්වාදෙන ආකාරයට පාසල සතු සම්පත් හා ශිෂ්‍ය ජයග්‍රහණ අතර සංඛ්‍යානමය සම්බන්ධයක් නොමැත. පාසල සතු භෞතික සම්පත් ප්‍රමාණය ශිෂ්‍ය ජයග්‍රහණ සඳහා බලපෑම් නො කරන බව එමගින් අවධාරණය කරයි. “ඵලදායී ඉගැන්වීම හා ඉගෙනීම සඳහා ප්‍රමාණවත් භෞතික සම්පත් පැවතීම අවශ්‍ය වේ. එහෙත් පවතින සීමිත භෞතික සම්පත් කාර්යක්ෂම ලෙස සැලසුම් කිරීම මගින් පාසල් ප්‍රතිඵල ඉහළ නැංවීමේ හැකියාව පවතී” (Dress & Senapathy, 2022). පවතින භෞතික සම්පත් කාර්යක්ෂම ලෙස සැලසුම් කිරීම මගින් ශිෂ්‍ය ජයග්‍රහණ අත්පත් කරගත හැකි බව පෙන්වා දෙමින් භෞතික සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව ඒ හරහා අවධාරණය කොට ඇත.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ භෞතික සම්පත් ගැටලු කළමනාකරණය කර ගැනීමේ වගකීම පාසල සතු වේ. ඒ සඳහා විවිධ ප්‍රවේශ අනුගමනය කළ හැකි අතර “අවම භෞතික සම්පත් සහිත පාසලක් ශිෂ්‍ය ජයග්‍රහණ තහවුරු කිරීම සඳහා සීමිත භෞතික සම්පත් කළමනාකරණය කරගන්නා ආකාරය” පිළිබඳ ව සිදුකළ ප්‍රත්‍යෙයක අධ්‍යයනයක් මගින් එය අනාවරණය වී තිබේ. භෞතික සම්පත් කළමනාකරණය සම්බන්ධ න්‍යායන් මගින් ද ඊට අවශ්‍ය මග පෙන්වීම් සිදුකර ඇත. ඒ අනුව සීමිත භෞතික සම්පත් කළමනාකරණයට මග පෙන්වන කළමනාකරණ න්‍යායන් සාකච්ඡා කිරීමත්, ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මුහුණදෙන භෞතික සම්පත් ගැටලු මගහරවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග ප්‍රත්‍යෙයක අධ්‍යයනයේ අනාවරණ ඔස්සේ සාකච්ඡා කිරීම ද මෙම ලිපිය මගින් සිදු කෙරේ.

අවම භෞතික සම්පත් කළමනාකරණයට මගපෙන්වන කළමනාකරණ න්‍යායන්

1. සම්පත් කළමනාකරණය පිළිබඳ සම්පත් යැපුම් න්‍යාය

Chester Barnard සහ Herbert Simon යන විද්වතුන් විසින් ඉදිරිපත් කරන ලද සම්පත් කළමනාකරණය පිළිබඳ සම්පත් යැපුම් න්‍යාය ආයතනික කළමනාකරණය සම්බන්ධ ව වැදගත් න්‍යායක් ලෙස හඳුනා ගත හැකි ය. බාහිර පරිසරයෙන් සම්පත් අත්කර ගනිමින් හා යැපෙමින් සංවිධාන ක්‍රියාත්මක වන ආකාරය අවධාරණය කරයි (Biermann & Harsch, 2017).

මෙම න්‍යාය තුළ සම්පත් හිඟකම හා යැපීම පිළිබඳ අවධානය යොමු කරයි. සංවිධාන ක්‍රියාකාරීත්වය සඳහා අමුද්‍රව්‍ය, මූල්‍ය ප්‍රාග්ධනය, භෞතික සම්පත්, මානව කුසලතා හා තොරතුරු ඇතුළු සම්පත් අවශ්‍යවන බවත් බොහෝවිට මෙම සම්පත් හිඟ හා අසමාන ලෙස බෙදා හරින බැවින් ඒවා ලබා ගැනීම සඳහා බාහිර ක්‍රියාකාරීන් මත යැපීමට සිදු වන බවත් පෙන්වා දී ඇත. ඊට අමතර ව තරඟකාරී පරිසරයක් තුළ අඛණ්ඩ පැවැත්ම හා දියුණුව සඳහා සම්පත් කළමනාකරණයේ අවශ්‍යතාව පෙන්වා දෙන අතර සංවිධානයේ ව්‍යුහය, උපාය මාර්ග හා තීරණ ගැනීමේ ක්‍රියාවලින් ඊට බලපාන බව පෙන්වා ඇත (Biermann & Harsch, 2017).

සම්පත් සංවර්ධනය කිරීමට හා ආදේශන ක්‍රම භාවිතයට පවතින සම්පත් කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාකාරී ලෙස අනුගමනය කිරීමට සම්පත් සපයන්නන් සමග සබඳතා වර්ධනය කර ගැනීමට හා උපාය මාර්ගික ව සම්පත් ළඟාකර ගැනීම සඳහා මෙම න්‍යාය හරහා අවබෝධය ලබා දෙයි (Biermann & Harsch, 2017).

2. සම්පත් බලමුලු ගැන්වීමේ න්‍යාය

ඇමරිකානු සමාජ විද්‍යාඥ Jhon D. McCarthy හා Mayer N. & Zaldn විසින් 1970 වර්ෂයේ දී සම්පත් බලමුලු ගැන්වීමේ න්‍යාය ඉදිරිපත් කර ඇත. සම්පත් සීමාවන්ට මුහුණ දෙන සංවිධානවලට සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ උපාය මාර්ග මගින් සම්පත් අත්පත් කර ගැනීමටත්, භාවිත කිරීමටත් හැකි බව අවධාරණය කරයි. Edwards & Gilham (2013) පෙන්වා දෙන ආකාරයට මෙම න්‍යාය යටතේ සම්පත් ප්‍රධාන ආකාර කිහිපයක් හඳුන්වා දී තිබේ.

- ද්‍රව්‍ය සම්පත් - අරමුදල්, උපකරණ, ගොඩනැගිලි, සන්නිවේදන මෙවලම් හා වෙනත් ස්පර්ශ වත්කම් වෙත ප්‍රවේශ වීම.
- මානව සම්පත් - නායකත්වය, දක්ෂ සාමාජිකයන්, ස්වේච්ඡා සේවකයන් හා ඔවුන්ගේ විශේෂඥතාව පැවතීම.
- ආයතනික සම්පත් - විධිමත් ව්‍යුහයන්, ස්ථාපිත ජාල සහ කාර්යක්ෂම බලමුලු ගැන්වීමේ උපාය මාර්ග අනුගමනය කිරීම.

මෙම සම්පත් සම්බන්ධ සීමාවන් හඳුනා ගැනීම, සම්පත් විගණනය හෙවත් පවතින සම්පත් හඳුනා ගැනීම, සම්පත් සහිත බාහිර පාර්ශ්ව හඳුනා ගැනීම, බාහිර පාර්ශ්ව සමග සම්පත් බෙදා ගැනීම, පවතින සම්පත් අලූත්වැඩියා කිරීම, නවෝත්පාදනය හෙවත් ආදේශන ක්‍රම භාවිතය හා සම්පත් අත්කර ගැනීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව වධානය යොමු කළ යුතු බව මෙම න්‍යාය ඔස්සේ පෙන්වා දී ඇත (Edwards & Gilham, 2013).

භෞතික සම්පත් ගැටලු මග හැරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය භෞතික සම්පත් බාධාවකින් තොර ව පවත්වා ගැනීම සඳහා භෞතික සම්පත් කළමනාකරණ ප්‍රවේශ රැසක් අනුගමනය කළ හැකි ය. ප්‍රත්‍යෙයක අධ්‍යයනයේ දී හඳුනාගත් කළමනාකරණ ප්‍රවේශ මත පදනම් ව ඒවා විග්‍රහ කෙරේ.

- ආදේශක ඉගෙනුම් උපකරණ භාවිත කිරීම

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය උදෙසා ඉගෙනුම් උපකරණ අත්‍යවශ්‍ය වේ. අත්‍යවශ්‍ය ඉගෙනුම් උපකරණ නොමැති අවස්ථාවල දී ඊට සුදුසු ආදේශක උපකරණ භාවිත කිරීම ප්‍රස්තුත පාසලේ ගුරුවරු අනුගමනය කළ ක්‍රියාමාර්ගයකි. විද්‍යාව විෂයය ඉගැන්වීම්වලට අවශ්‍ය ශරීර පද්ධති ආකෘති පාසලේ නොමැති නිසා රිජෆෝර්ම් භාවිතයෙන් ශරීර පද්ධති ආකෘති නිර්මාණය කර ඇත. ඒවා ඉගැන්වීම් ක්‍රියාවලියට දීර්ඝ කාලයක් භාවිත කර තිබේ. සංගීතය විෂයය තුළ ගීත ශ්‍රවණයට හා වීඩියෝ ප්‍රදර්ශනයට ශ්‍රව්‍ය දෘශ්‍ය අංශයක් නොමැති නිසා ජංගම දූරකථනයක්, කුඩා මයික්‍රෆෝනයක් හා සුහුරු පරිගණකයක් වැනි දෑ භාවිත කිරීම සිදු කර ඇත. සර්පිනාව වාදනයට සිසුන් හුරු කරවීම සඳහා ප්‍රමාණවත් සංගීත භාණ්ඩ නොමැති නිසා හාඩ්බෝඩ් භාවිතයෙන් නිර්මාණය කරගත් ස්වර පුවරු භාවිත කර ඇත. එමගින් සර්පිනාව වාදනයට පෙර ඒ සඳහා ඇඟිලි හුරු කරගැනීමට සිසුන්ට හැකියාව ලැබේ. මෙවැනි ආදේශක ඉගෙනුම් උපකරණ බොහෝමයක් පාසල තුළ නිර්මාණය කර ගෙන සාර්ථක අධ්‍යාපනයක් ලබා දීම සඳහා ඒවා යොදා ගෙන ඇත.

මේ ආකාරයට භෞතික සම්පත් සම්බන්ධ ගැටලු අවම කරගැනීම සඳහා ආදේශක ඉගෙනුම් උපකරණ භාවිත කිරීමේ හැකියාව පවතී. සම්පත් කළමනාකරණය පිළිබඳ සම්පත් යැපුම් න්‍යායෙහිත්, සම්පත් බලමුලු ගැන්වීමේ න්‍යායෙහිත් “ආදේශන ක්‍රම භාවිතය” ලෙස මෙය අවධාරණය කොට ඇත. ගුරුවරයාගේ නිර්මාණශීලිත්වය හා ශිෂ්‍යයාගේ දායකත්වය ඇති ව ආදේශක ඉගෙනුම් උපකරණ සකස් කරගත හැකි ය. එය ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මෙන් ම ශිෂ්‍ය රුචිකත්වය තුළින් ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා ද ඉතා වැදගත් වනු ඇත.

- ආචාර්ය මණ්ඩලය සමග සුහදශීලී සබඳතා මගින් සම්පත් ළඟාකර ගැනීම.

ඕනෑ ම ආයතනයක සාර්ථක ක්‍රියාකාරීත්වය සඳහා කාර්ය මණ්ඩලය අතර පවතින සුහදශීලි සම්බන්ධතා හා අන්‍යෝන්‍ය අවබෝධය වැදගත් වේ. Jhon D. McCarthy හා Mayer N. & Zaldn හඳුන්වා දී ඇති සම්පත් බලමුලු ගැන්වීමේ න්‍යායෙහි සම්පත් පවතින පාර්ශ්ව හඳුනා ගැනීම හා සම්පත් බෙදා ගැනීමේ

හැකියාව පෙන්වා දී ඇත. ප්‍රත්‍යෙයක අධ්‍යයනය සිදු කළ පාසල තුළ මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක වේ. තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණය විෂයය හදාරන සිසුන් ප්‍රමාණය වැඩි බැවින් පුස්තකාලයේ පුටු භාවිතයට ගනී. පාසලේ චිත්‍ර කාමරයක් නොමැති නිසා බලා ඇඳීම් ක්‍රියාකාරකම් සඳහා සුදුසු අවස්ථාවල පුස්තකාලය ප්‍රයෝජනයට ගෙන ඇත. සංගීත කාමරයේ පුවරුවක් නොමැති නිසා එක ශ්‍රේණියේ සිසුන් අකුරු හුරුවෙන සුදු පුවරුව ඒ සඳහා භාවිත කර ඇත. වීඩියෝ නැරඹීම සඳහා තොරතුරු තාක්ෂණ කාමරයේ සහයෝගය ලබාගෙන තිබේ. ගීත ශ්‍රවණය සඳහා පාසලේ ගුරුවරයෙකුගේ කුඩා ශබ්ද විකාශන යන්ත්‍රයක් ප්‍රයෝජනයට ගෙන ඇත. විද්‍යාව විෂයයට අදාළ ශරීර පද්ධති නිර්මාණය සඳහා පෙර සිටි චිත්‍ර ගුරුවරයෙකුගේ සහයෝගය ලබාගෙන ඇත.

ඒ අනුව පාසලක ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ මුහුණදෙන භෞතික සම්පත් ගැටලු මගහරවා ගැනීමට සුහදශීලී සම්බන්ධතා වැදගත් වේ. පාසලක විවිධ පාර්ශ්ව සතු ව විවිධ සම්පත් පවතී. එම පාර්ශ්ව සතු සම්පත් හා හැකියා හඳුනාගෙන අන්‍යෝන්‍ය සබඳතා තුළින් ඒවා හුවමාරු කරගත හැකි ය. මෙසේ සහයෝගී සබඳතා පවත්වා ගැනීම තුළින් එකිනෙකා උපකාර කර ගැනීමට පෙළඹේ. එය භෞතික සම්පත් ගැටලු කළමනාකරණය කර ගැනීමට වැදගත් ප්‍රවේශයකි.

- ඉගැන්වීම සඳහා සහයෝගී ඉගෙනුම් සම්පත් ප්‍රවේශය අනුගමනය කිරීම

ඇතැම් අවස්ථාවල භෞතික සම්පත් නොමැතිකම ඉගැන්වීම් ක්‍රියාවලියට බාධාවකි. තවත් විටෙක භෞතික සම්පත් ප්‍රමාණවත් නො වීම ඉගැන්වීම් කාර්යයට බාධාවකි. ප්‍රත්‍යෙයක අධ්‍යයනයට පාදක වූ පාසල භෞතික සම්පත් ප්‍රමාණවත් නො වන අවස්ථාවල සහයෝගී ඉගෙනුම් ප්‍රවේශයක් අනුගමනය කර ඇත. එය ඉගැන්වීම් කාර්යය සඳහා සාර්ථක ප්‍රවේශයකි. උදාහරණ ලෙස පරිගණක කාමරයේ පරිගණක තුනක් පමණක් ඇති නමුත් තොරතුරු සන්නිවේදනය හා තාක්ෂණය හදාරන සිසුන් ප්‍රමාණය ඊට වඩා වැඩි ය. ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා එය බාධාවකි. එවැනි අවස්ථාවල සිසුන් කණ්ඩායම් කර සහයෝගි ඉගෙනුම් ක්‍රමයක් නිර්මාණය කර ඇත. සංගීතය විෂයය තුළ සියලු දෙනාට වාදනය කිරීමට තරම් වාද්‍ය භාණ්ඩ නොමැත.එම නිසා වයලීනය හා සර්පිනාව සිසුන් කණ්ඩායම් දෙකකට ලබා දී පුහුණුවීමට අවස්ථාව සලසා ඇත. පාසලේ ඇති ගුණාත්මක වර්ගයේ දියසායම් පෙට්ටි දෙක චිත්‍ර විෂයය හදාරන සිසුන් සහයෝගයෙන් පරිහරණය කරනු ලැබේ. ප්‍රායෝගික ක්‍රියාකාරකම් බහුල විෂයයන් ඉගැන්වීම් සඳහා මෙය ඉතා වැදගත් ප්‍රවේශයකි.

මෙය භෞතික සම්පත් සීමා අවම කර ගැනීමට යෝග්‍ය කළමනාකරණ ශිල්පයකි. ඊට අමතර ව එකිනෙකාගෙන් ඉගෙනීමට ද අවස්ථාවක් නිර්මාණය කරනු ලබයි. සමීපතමයන් ඇසුරෙන් ඉගෙනීම ශිෂ්‍ය රුචිකත්වය වර්ධනය කරන බැවින් එය වඩාත් සාර්ථක ඉගෙනුම් ප්‍රවේශයක් ලෙස ද හඳුනාගත හැකි ය. ඊට අමතර ව කණ්ඩායම් වශයෙන් කටයුතු කිරීම නිසා ශිෂ්‍යයන්ගේ මෘදු කුසලතා සංවර්ධනය වීමක් ද සිදු වේ.

- විකල්ප ඉගැන්වීම් ස්ථාන භාවිත කිරීම

බොහොමයක් දුෂ්කර ප්‍රදේශවල පාසල්වල දක්නට ලැබෙන භෞතික සම්පත් සම්බන්ධ ගැටලුවක් වන්නේ විෂය කාමර නොමැති වීම හෝ ඉඩ ප්‍රමාණවත් නො වීම යි. අධ්‍යයනය සිදු වූ දුෂ්කර පාසලේ චිත්‍ර කාමරයක් නොමැත. සංගීත කාමරය හා විද්‍යා කාමරය සිසුන් සඳහා ප්‍රමාණවත් නො වන කුඩා කාමර දෙකකි. සංගීතය හදාරන සිසුන් සංගීත කාමරය භාවිත කරන නිසා චිත්‍ර ගුරුවරයා පන්ති කාමරයේ ඉගැන්වීම් සිදු කරනු ලැබේ. බලා ඇඳීම් සඳහා පන්ති කාමරය යෝග්‍ය නො වන නිසා එළිමහන හෝ පුස්තකාලය භාවිත කර ඇත. සංගීත කාමරය ප්‍රමාණවත් නො වන නිසා හා අනාරක්ෂිත බැවින් සංගීත ගුරුවරයා එළිමහන් පන්ති කාමර ක්‍රමය අනුගමනය කරනු ලබයි. විද්‍යා ගුරුවරයා පරීක්ෂණ සඳහා පමණක් විද්‍යා කාමරය භාවිතයට ගෙන ඇත.

ඒ අනුව විකල්ප ඉගෙනුම් ස්ථාන භාවිත කිරීම මගින් සාර්ථක ඉගැන්වීමක් සිදු කිරීමට පාසලේ ගුරුවරු කටයුතු කර ඇත. මෙය සීමිත භෞතික සම්පත් කළමනාකරණයට යොදා ගත හැකි වැදගත් ප්‍රවේශයකි. එළිමහන් පන්තිකාමර ක්‍රමයට සිසුන් වැඩි රුචිකත්වයක් දක්වන බව හා එම ඉගැන්වීම වඩා සාර්ථක බව ක්ෂේත්‍ර දත්ත ඇසුරෙන් අනාවරණය විය. භෞතික සම්පත් නොමැති හා සීමිත වාතාවරණය වඩාත් සාර්ථක ඉගෙනුමක් ලබා දීමට සුදුසු පරිදි හැඩගස්වා ගැනීමට එම පාසලේ ගුරුවරුන්ට හැකියාව ලැබී ඇත.

- අන්තර් පාසල් සබඳතා තුළින් සම්පත් ළඟා කර ගැනීම

ආසන්නයේ පවතින පහසුකම් සහිත පාසල් සමඟ සබඳතා පවත්වමින් සම්පත් සීමා අවමකර ගැනීම සඳහා ඔවුන්ගේ උපකාර ලබා ගැනීම පාසල තුළ සිදුවන වැදගත් ක්‍රියාමාර්ගයකි. පාසලේ පවතින සම්පත්වලට සාපේක්ෂ ව ප්‍රදේශයේ අනෙක් පාසල්වල පවතින පහසුකම් හඳුනාගෙන ඔවුන් සමඟ මිත්‍රශීලි සබඳතා ගොඩනගා ගෙන ඇති අතර ඒ ඇසුරෙන් උපායමාර්ගික ව සම්පත් ගැටලු මග හරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. ආසන්නයේ පවතින ජාතික පාසලෙන් ඉවත් කළ පරිගණක මේස කිහිපයක් පාසලේ පරිගණක කාමරයට ලබා ගෙන ඇති අතර ඒ සඳහා ඉහළ අධ්‍යාපන පරිපාලන නිලධාරීන්ගේ සහය ද ලබා ගෙන ඇත. සංගීත විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණ පුහුණුවීම් සඳහා අවශ්‍ය වයලීනයක් හා ගිටාරයක් ජාතික පාසල හරහා හුවමාරු පදනමෙන් ලබා ගැනීම වාර්ෂික ව සිදු කර තිබේ. විද්‍යාව ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අවශ්‍ය සියලු උපකරණ පාසලේ නොමැති බැවින් ජාතික පාසල හා එක් ව ප්‍රායෝගික පරීක්ෂණ වැඩමුළුවක් ක්‍රියාත්මක කර ඇත. එකිනෙකාගේ භෞතික හා මානව සම්පත් හුවමාරු කරමින් සිදු කෙරෙන මෙම වැඩමුළුව අඛණ්ඩ ව වසර හයක් වාර්ෂික ව පවත්වා ඇත.

ඒ අනුව සම්පත් පවතින පාසල් හඳුනා ගෙන එම පාසල් සමඟ සුහදශීලී ලෙස කටයුතු කර භෞතික සම්පත් ළඟා කර ගැනීමේ හැකියාව පවතී. සම්පත් සහිත බාහිර පාර්ශ්ව හඳුනාගැනීමත්, එම පාර්ශ්ව මගින් සම්පත් ලබා ගැනීමත් සම්පත් සීමා අවම කර ගැනීමේ ක්‍රියාමාර්ගයක් ලෙස සම්පත් බලමුලු ගැන්වීමේ න්‍යායේ දක්වා ඇති බව Edwards & Gilham (2013) පෙන්වා දී ඇත. මෙය බොහොමයක් භෞතික සම්පත් ගැටලු මග හරවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි සම්පත් කළමනාකරණ ප්‍රවේශයකි.

- සම්පත් අලුත්වැඩියා කිරීම

පාසලේ පවතින සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමේ උත්සාහයක් ලෙස මෙය වැදගත් වේ. අලුත්වැඩියා කිරීමට හැකි සියලු ම දේ නැවත ප්‍රයෝජනයට ගත හැකි අයුරින් සකස් කිරීම මෙම පාසලේ වැදගත් කළමනාකරණ ලක්ෂණයකි. සංගීත කාමරයේ බිම දෙමාපිය සහයෝගය ඇති ව නැවත පිළිසකර කර ඇති අතර අබිලි වූ ඩෙස් පුටු ද දෙමාපියන් විසින් නැවත ප්‍රතිසංස්කරණය කොට ඇත. මැටි ගොඩනැගිල්ලක පවතින එකොළහ ශ්‍රේණියේ පන්ති කාමරයේ වහලය බාහිර සංවිධානයක සහය ඇති ව තහඩු යොදා ආවරණය කර ඇත. සංගීත විෂයයට අදාළ සර්පිනාව ද අලූත්වැඩියාවකින් පසු ප්‍රයෝජනයට ගනු ලබේ. පවතින භෞතික සම්පත් මැනවින් ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග පාසල්වල අනුගමනය නොකෙරෙන බව පාසල්වල භෞතික සම්පත් කළමනාකරණය කිරීමේ ස්වරූපය පිළිබඳ ව සිදුකළ අධ්‍යයනයකින් එදුසූරිය(2006) පෙන්වා දී ඇතත් සෑම පාසලක් සඳහා ම එය සාධාරණ නො වන බව මෙම අධ්‍යයනය ඇසුරෙන් හඳුනා ගත හැකි ය.

මේ ආකාරයට පවතින සීමිත සම්පත් අලුත්වැඩියා කරමින් නැවත ප්‍රයෝජනයට ගත හැකි ය. සම්පත් නොමැති වීම හේතුවෙන් පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අසාර්ථක කර ගැනීමට වඩා පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම මගින් සාර්ථක අධ්‍යාපනයක් ලබා දීමට හැකියාව ලැබෙනු ඇත. මෙය අභ්‍යන්තර හා බාහිර පාසල් ප්‍රජාවේ සහයෝගයෙන් සමස්ත පාසල් පද්ධතිය තුළ ම අනුගමනය කළ හැකි භෞතික සම්පත් කළමනාකරණ උපාය මාර්ගයකි.

- පාසලෙන් පරිබාහිර සංවිධාන හා වෙනත් ආයතන සමග සම්බන්ධතා පැවැත්වීම

පාසලෙන් පරිබාහිර සංවිධාන හා වෙනත් ආයතන මාර්ගයෙන් භෞතික සම්පත් ලබා ගැනීම පාසල්වල ක්‍රියාත්මක වන ප්‍රශස්ත භෞතික සම්පත් කළමනාකරණ උපායමාර්ගයකි. දේශපාලන අධිකාරියට සම්බන්ධ පුද්ගලයන්, වෙනත් ව්‍යාපාරික ආයතන හා පාසලේ ආදි ශිෂ්‍යයන් සමඟ සබඳතා පවත්වා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය උපකාර ලබා ගෙන ඇත. සම්පත් සපයන්නන් සමඟ සබඳතා වර්ධනය කර ගැනීම හා උපායමාර්ගික ව සම්පත් අත්කර ගැනීම සම්බන්ධ ව සම්පත් කළමනාකරණය පිළිබඳ සම්පත් යැපීම් න්‍යාය තුළත් සම්පත් බලමුලු ගැන්වීමේ න්‍යාය තුළත් සඳහන් වේ. පාසල තුළ සම්පත් කළමනාකරණය සඳහා ද එම ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

ඒ අනුව සහයෝගය ලබා ගත හැකි ආයතන, පුද්ගලයන් හා සංවිධාන හඳුනා ගෙන ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම වැදගත් වේ. එම පාර්ශ්ව හරහා භෞතික සම්පත් සීමා අවම කර ගැනීමට අවශ්‍ය උපකාර ලබා ගත හැකි ය. මෙය පාසල් පරිපාලකයන්ට හා ගුරුවරුන්ට අනුගමනය කළ හැකි භෞතික සම්පත් කළමනාකරණ උපායමාර්ගයකි.

- පාසලේ මානව සම්පත් වග වීමෙන් කටයුතු කිරීම.

පාසල තුළ පවතින සීමිත සම්පත් මැනවින් කළමනාකරණය කර ගනිමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සම්බන්ධ ව පාසල් මානව සම්පතේ ක්‍රියාකාරීත්වය වඩාත් ඉස්මතු ව පෙනේ.

සම්පත් ගැටලු අවම කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හා ඉවසීමෙන් යුතු ව දුෂ්කරතාවලට මුහුණ දෙමින් විදුහල්පති ප්‍රමුඛ ආචාර්ය මණ්ඩලයත්, අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ප්‍රජාවත් ඉහළ කැපවීමකින් යුතු ව කටයුතු කරන බව පැහැදිලි විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා භෞතික සම්පත් අත්‍යවශ්‍ය වුවත් මානව සම්පතේ කැපවීම හා ක්‍රියාකාරිත්වය මත සම්පත් ගැටලු අවම කරගත හැකි බව මෙම අධ්‍යයනය ඇසුරෙන් හඳුනා ගෙන ඇත. ඒ අනුව වඩාත් වැදගත් වන්නේ භෞතික සම්පත් නොව එම සම්පත් ගැටලු අවම කර ගැනීම සඳහා කැපවීමෙන් හා වග වීමෙන් යුතු ව ක්‍රියාත්මක විය හැකි මානව සම්පතක් බව අධ්‍යයනය ඇසුරෙන් හඳුනා ගන්නා ලදී.

පාසල්වල භෞතික සම්පත් කළමනාකරණය සම්බන්ධ ව සියලූ පාසල් පාර්ශ්වයන්ට වගකීමක් හිමි වේ. අවස්ථාව අනුව වඩාත් යෝග්‍ය කළමනාකරණ ශිල්ප ක්‍රම තෝරා ගනිමින් පාසල් පරිපාලකයන් හා ආචාර්ය මණ්ඩලය කටයුතු කළ යුතු ය. ඒ සඳහා ශිෂ්‍ය ප්‍රජාවේ හා බාහිර පාර්ශ්වවල සහයෝගය ද ලබා ගැනීම වැදගත් වේ. ඒ අනුව පාසල්වල මානව සම්පත කැපවීමෙන් කටයුතු කිරීම මගින් භෞතික සම්පත් සම්බන්ධ ගැටලු අවම කරගත හැකි ය.

සාරාංශය

සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා පාසල්වල භෞතික සම්පත් ප්‍රමාණවත් ලෙස පැවතීම අත්‍යවශ්‍ය වේ. ඒ බව විවිධ පර්යේෂකයන් විසින් විවිධ අධ්‍යයන හරහා අනාවරණය කර ඇත. පාසලක සාර්ථකත්වය සඳහා භෞතික සම්පත් අත්‍යවශ්‍ය වුවත් පවතින භෞතික සම්පත් මැනවින් කළමනාකරණය කිරීම හරහා සම්පත් සීමාවන් අවම කරගත හැකි බව ද විවිධ පර්යේෂකයන් විසින් පෙන්වා දී ඇත. ඒ සඳහා සම්පත් කළමනාකරණය පිළිබඳ සම්පත් යැපුම් න්‍යායේ හා සම්පත් බලමුලු ගැන්වීමේ න්‍යායේ මග පෙන්වීම් ආදර්ශයට ගැනීමේ හැකියාව පවතී.

පාසලක භෞතික සම්පත් කළමනාකරණය කිරීම සඳහා පාසලේ සියලූ පාර්ශ්වවලට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග කිහිපයකි. පාසලක අවම භෞතික සම්පත් කළමනාකරණය සම්බන්ධ ව සිදුකළ ප්‍රත්‍යයක අධ්‍යයනයට අනුව ඉගැන්වීම් ක්‍රියාවලියට අවශ්‍ය ආදේශක ඉගෙනුම් උපකරණ භාවිත කිරීම, විකල්ප ඉගැන්වීම් ස්ථාන යොදාගැනීම, පාසල් කාර්ය මණ්ඩලය සමග සුහදශීලි සබඳතා පැවැත්වීම මගින් සම්පත් හුවමාරු කර ගැනීම, සම්පත් අලූත්වැඩියා කිරීම, අන්තර් පාසල් සබඳතා මගින් සම්පත් සපයා ගැනීම, පාසලෙන් පරිබාහිර සංවිධාන හා වෙනත් ආයතන සමග සබඳතා පවත්වා සම්පත් සීමා අවම කර ගැනීම හා පාසලේ මානව සම්පත වග වීමෙන් කටයුතු කිරීම මගින් භෞතික සම්පත් ගැටලු මගහරවා ගැනීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය මගින් භෞතික සම්පත් ගැටලු අවම කරගත හැකි බව අනාවරණය වී ඇත. මෙම භෞතික සම්පත් කළමනාකරණ ප්‍රවේශ සියලු ම පාසල්වල අනුගමනය කළ හැකි ය.ඒ සඳහා පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගනිමින් විවිධ ක්‍රම මගින් සම්පත් සපයා ගනිමින් හා භෞතික සම්පත් හසුරුවන මානව සම්පත් නිසි පරිදි කළමනාකරණය කිරීම අවශ්‍ය වේ. එ මගින් සම්පත් සීමා අවම කර ගැනීමටත්, සම්පත් සීමා මධ්‍යයේ වුව ද සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සිදු කිරීමටත් හැකියාව ලැබේ.

ආශ්‍රිත මූලාශ්‍ර

එදුසූරිය, ආර්. (2006). *ගවරප්‍රසාද අඩු ප්‍රදේශයක රජයේ පාසල්වල භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්* [අප්‍රකාශිත ආචාර්ය උපාධි නිබන්ධනය]. කොළඹ විශ්වවිද්‍යාලය.

Derese, M., & Senapathy, M. (2022). Physical resource management in government secondary schools, Wolaita Zone, Southern Ethiopia. *Shanlax International Journal of Education*, *11*(1), 84–93. https://doi.org/10.34293/education.v11i1.5176

Edwards, B., & Gillham, P. F. (2013). Resource mobilization theory. In D. A. Snow, D. Della Porta, B. Klandermans, & D. McAdam (Eds.), *The Wiley-Blackwell encyclopedia of social and political movements* (pp. 1109–1111). Wiley Blackwell.

Ibrahim, W. Y., Umar, H. A., & Clement, I. (2017). Impact of school facilities on students' academic achievement. *International Journal of Advanced Research*, *5*(12), 878–889.